**පළාත් පාලන සේවා වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල - 2017**

---

පළාත් පාලන සේවා වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලේ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1974 අංක 16 දරන පළාත් පාලන සේවා පනතේ 23 වන වගන්තිය යටතේ පනවන ලද 1986 පළාත් පාලන සේවා වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් නියෝග අංක 06 සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලැසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

---

### 2.1 තත්ත්වාගණනය කළ මතය

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට පළාත් පාලන සේවා වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලෙහි මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අරමුදල විසින් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කරන ලද රු.11,504,404 ක මුදල වියදමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබූ පෙර වර්ෂවලට අදාල විශ්‍රාම වැටුප් දායක මුදල් රු.15,069 ක් ආදායම් වියදම් ගිණුමේ ඌනතාවය ලෙස දක්වා තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

---

### 3.1 කාර්යසාධනය

---

1985 අංක 10 දරන පළාත් පාලන සේවා (සංශෝධිත) පනතේ 16(අ) වගන්තිය ප්‍රකාරව පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත සාමාජිකාවන්ගේ වැන්දඹු පුරුෂයන්ට සහ දරුවන්ට විශ්‍රාම වැටුප් ගෙවීමේ අරමුණින් මෙම අරමුදල පිහිටුවා තිබුණි. එසේ වුවද, 1993 වර්ෂයේ පළාත් රාජ්‍ය සේවය ස්ථාපිත වීමත් සමඟ පළාත් රාජ්‍ය නිලධාරින්හට රාජ්‍ය නිලධාරින්ට හිමි විශ්‍රාම වැටුප් හා වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ හිමිවීම නිසා 1993 සැප්තැම්බර් 03 සිට සමාලෝචිත වර්ෂය දක්වා මෙම අරමුදලට නව සාමාජිකයින් එකතුවීමක් සිදු වී නොතිබුණි. එලෙස නව සාමාජික මුදල් නොලැබීම නිසා මෙම නිලධාරින්ට ගෙවීමට ප්‍රමාණවත් තරම් මුදල් අරමුදලේ නොමැති වීම හේතුවෙන් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු වැය ශීර්ෂය යටතේ අයවැය ප්‍රතිපාදන මඟින් අරමුදලේ වියදම් දැරීම හේතුවෙන් මෙම අරමුදල පිහිටුවීමේ මූලික අරමුණු ඉටු වී නොතිබුණි.

### 3.2 මෙහෙයුම් ක්‍රියාකාරකම්

---

විශ්‍රාම වැටුපට හිමිකම් කියන විශ්‍රාමිකයින්ගේ යාවත්කාලීන කළ නාම ලේඛනයක් අරමුදල සතුව නොතිබූ බැවින් ප්‍රතිලාභීන් මියගිය විට ඒ සඳහා කළ යුතු ගැලපුම් කාර්යක්ෂමව සිදුනොවීම මත සාවද්‍ය ගෙවීම් සිදුවිය හැකිව තිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

---

### 4.1 අභ්‍යන්තර විගණනය

---

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපනය කර තිබූ නමුත් එම අංශය මඟින් හෝ මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේදී අරමුදලේ කටයුතු පිළිබඳව අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

## 5. පද්ධති හා පාලනයන්

---

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින් වර විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයා දැනුවත් කරන ලදී. විශ්‍රාම වැටුප් ගෙවීමේදී ප්‍රාදේශීය මට්ටමින් තොරතුරු කැඳවා අරමුදලේ සාමාජිකයින් පිළිබඳ තොරතුරු යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබීම සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුකළ යුතු වේ.